# පුද්ගලානුබද්ධ චයර්‍යාධමර් පද්ධතිය

## පාරිසරික, සමාජමය, සෞඛ්‍ය, ආරක්ෂක සහ වෘත්තීය සෞඛ්‍යයට සහ ආරක්ෂාවට සම්බන්ධ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් වැළැක්වීම

............................................................වන මම පාරිසරික, සමාජමය, සෞඛ්‍ය, සහ ආරක්ෂාව (ESHS) සම්බන්ධ ප්‍රමිතින් පිළිපැදීම, ව්‍යාපෘතියේ වෘත්තීයමය, සෞඛ්‍ය සහ ආරක්ෂාවට (OHS) අදාළ අවශ්‍යතාවයන් අනුගමනය කිරීම, සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන ක්‍රියාවන් (GBV) වැළැක්වීම වැදගත් බව පිළිගනිමි. වැඩබිම, වැඩබිම අවට, කම්කරු කඳවුරුවල හෝ අවට ප්‍රජාවන්හිදී වේවා ESHS සහ OHS ප්‍රමිතීන් අනුගමනය කිරීමට අපොහොසත්වීම හෝ GBV සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරතවීම දැඩි විෂමාචාර ක්‍රියාවන් බවට සමාගම සළකන හෙයින් ඒ අනුව ඒවා දඬුවම් පැනවීමට, දණ්ඩනවලට ලක්කිරීමට හෝ ඇතැම්විට සේවය අවසන් කිරීමට වුවද හේතු වේ. GBV ක්‍රියාවල යෙදෙන්නන්ට විරුද්ධව අවශ්‍ය නම් පොලීසිය විසින් නඩු පැවරීමටද කටයුතු කරනු ඇත.

එබැවින් ව්‍යාපෘතියේ සේවයේ නියුක්තව සිටින අතරතුර දී මෙහි සඳහන් ආචාර ධමර් පිළිපැදීමට මම එකග වෙමි.

1. පොලීසිය විසින් සිදුකරනු ලබන පසුබිම් තොරතුරු සෙවීමට කැමැත්ත පළ කිරීම.
2. මාගේ සේවා යෝජකයාගේ ඉල්ලීම පරිදි ESHS, OHS සහ GBV සම්බන්ධ පුහුණු වැඩසටහන්වලට සහභාගි වීම සහ ඒවාට ක්‍රියාශීලීව සම්බන්ධවීම.
3. වැඩබිමේ සිටින විට දී සහ ව්‍යාපෘතියට සම්බන්ධ කටයුතුවල නිමග්නව සිටිනා සෑම අවස්ථාවකදීම මාගේ පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) පැළඳගෙන සිටීම.
4. කොන්ත්‍රාත්කරුගේ පාරිසරික සහ සමාජ කළමනාකරණ සැළැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සෑම ප්‍රායෝගික පියවරයන්ම ගැනීම.
5. රැකියාශ්‍රිත සෞඛ්‍ය ආරක්ෂණ කළමනාකරණ සැළැස්ම ක්‍රියාත්මක කිරීම.
6. සේවයේ යෙදී සිටින අවස්ථාවන්හිදී මධ්‍යසාර භාවිතයෙන් තොර ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට සහ මොළයේ ක්‍රියාකාරිත්වයන් නිතරම අඩපණ කරන්නා වූ මත්ද්‍රව්‍ය හෝ වෙනත් අන්තරායකාරී ඖෂධ භාවිතයෙන් වැළකී සිටීම.
7. වගර්ය, ශරීර වණර්ය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මතිමතාන්තර, ජාතික, ජනවාගරීක හෝ සමාජ සම්භවය, දේපල වත්කම්, ආබාධිත බව, උපත හෝ වෙනත් තත්ත්වයන් සළකිල්ලට නොගෙන සියළුම කාන්තාවන්ට, වයස අවුරුදු 18ට අඩු ළමයින්ට, සහ පුරුෂයින්ට ගෞරවාන්විත ලෙස සැළකීම.
8. කාන්තාවන්ට, ළමයින්ට සහ පුරුෂයින්ට නොගැළපෙන හිංසාකාරී, දෝෂාරෝපණ- බැනවැදීම්, ලිංගික වශයෙන් ප්‍රකෝපකාරී, පහත් කොට සළකන්නා වූ, සංස්කෘතික වශයෙන් නුසුදුසු, ඇමතීම්වලින් හෝ හැසිරීම්වලින් වැළකී සිටීම.
9. ව්‍යාපෘති ප්‍රතිලාභීන් සහ අවට ප්‍රජාවන්හි සාමාජිකයින් ලිංගික සූරාකෑම්වලට හෝ අපයෝජනය කිරීමෙන් වැළකී සිටීම.
10. සේවක පිරිස හා කායර් මණ්ඩලයට ලිංගික හිරිහැර නොකිරීම. උදා- අනාරාධිත ලිංගික චයර්‍යා සඳහා පෙළඹවීම ලිංගික අනුග්‍රහයන් නොපැතීම සහ ලිංගික ස්වභාවයේ වෙනත් වාචික හෝ ශාරිරික ක්‍රියාවන් සපුරා තහනම් වේ. උදා- කෙනෙකු දෙස පාදාන්තයේ සිට කේශාන්තය දක්වා බැලීම්; සිපගැනීම්, උස් හඬින් කථා කිරීම හෝ ශබ්ද කිරීම; නුසුදුසු ලෙස කෙනෙකු ළඟ ගැවසීම; සුරුවම් බෑම සහ නොමනා ශබ්ද සහ ලිංගික ස්වභාවය හුවා දැක්වෙන අභිනයන් ; සමහර විටෙක පෞද්ගලික ත්‍යාග ලබා දීම.
11. ලිංගික අනුග්‍රහයන් හි නොයෙළීම - උදා- විශේෂ සැළකිලි පිළිබඳ පොරොන්දු දීම (උදා- සේවයේ උසස් කිරීම වැනි), අයහපත් ප්‍රතිවිපාක දක්වන තජර්න (සේවයෙන් පහ කිරීම) හෝ මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ගෙවීම්, වෙනත් ආකාරයේ නින්දිත, පහත් හැසිරීම් හෝ පළිගැනීම් සහගත හැසිරීම්
12. කිසිම විටෙක කිසිම ආකාරයක ගණිකා වෘත්තිය භාවිතා නොකිරීම.

13. ඇඳුම් පැළඳුමින් හෝ ඩිජිටල් මාධ්‍ය හරහා සම්බන්ධවීම් ඇතුළුව වයස අවුරුදු 18ට අඩු ළමයින් සමඟ ලිංගික සම්බන්ධතා හෝ ලිංගික ක්‍රියාවල නොයෙදීම. ළමයකුගේ වයස පිළිබඳව වැරදි නිශ්චය නිදහසට කාරණාවක් නොවේ. දරුවාගේ කැමැත්ත මත එවැන්නක් කිරීමද සමාවට හෝ නිදහසට කරුණක් නොවේ.
14. අදාළ සියළුම පාශර්වයන්හි පූණර් කැමැත්ත[1] නොමැතිව, අවට ප්‍රජාවන්හි සාමාජිකයින් සමඟ ලිංගික සබඳතා මා හට පැවැත්විය නොහැකිය. ප්‍රතිලාභ නොගෙවා රඳවා ගැනිම් හෝ සත්‍ය වශයෙන්ම ප්‍රජාවේ සාමාජිකයින්ට වන පොරොන්දු (මූල්‍යමය හෝ මූල්‍යමය නොවන) සත්‍ය ප්‍රතිලාභවල සැපයීම් (මූල්‍යමය හෝ මූල්‍යමය නොවන) රඳවා ගැනිම් හෝ ලබා දෙන බවට පොරොන්දුවීම් ආදියද මෙයට ඇතුළත් වේ.
15. GBV හිංසනයන් සත්‍ය වශයෙන්ම සිදුවීමේදි හෝ එවැන්නක් යැයි සැක කෙරෙන අවස්ථාවලදී මෙන්ම මෙම චයර්ාධමර් පද්ධතිය කිසියම් ලෙසකින් උල්ලංඝනය වන්නා වූ අවස්ථාවලදී එය සිදු කරන පුද්ගලයා මා අයත් සමාගමේ කෙනෙකු වුවත් නොවූවත් දුක්ගැනවිලි කමිටුවට හෝ මාගේ කළමනාකරුට වාතර්ා කිරීමට සැළකිළිමත් වීම.

## වයස අවුරුදු 18 ට අඩු ළමයින් සම්බන්ධයෙන්:

16. ඉදිකිරීම් භූමියේ ළමයින් සිටී නම් හෝ අන්තරාදායක ක්‍රියාකාරකම්වල යෙදී සිටී නම් ඒ බව මාගේ කළමනාකරුගේ අවධානයට යොමු කිරීම.
17. ළමයින් ආසන්නයේ වැඩ කරන විටදී වැඩිහිටි පුද්ගලයෙකු ඒ අසල සිටිය යුතු බවට හැකි සෑමවිටකම වග බළා ගැනීම.
18. මාගේ ඥාති නොවන කිසිම දරුවෙකු, හදිසි තත්ත්වයක් මත වහාම ප්‍රතිකාර කිරීමට අවශ්‍ය විටෙක හෝ ශාරිරික වශයෙන් අනතුරකට ලක්වීමේ අවදානමක සිටින අවස්ථාවක හැර මාගේ නිවසට තනිව කැඳවා ගැනිමෙන් වැළකී සිටීම.
19. ළමයින් ලිංගික සූරාකෑමට හෝ හිරිහැරයකට ලක් කිරීමට හෝ ළමා අසැබි දශර්න නැරඹීමට ඉඩ සළසන කිසිදු පරිඝණයක්, ජංගම දුරකථන, වීඩියෝ සහ ඩිජිටල් කැමරා හෝ වෙනත් මාධ්‍යයක් භාවිතා නොකිරීම (පහත සඳහන් "සේවා අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් ළමා ඡායාරූප භාවිතා කිරීම" ද බලන්න).
20. ළමයින්ට ශාරිරික දඩුවම් කිරීමෙන් හෝ හික්මවීමෙන් වැළකී සිටීම.
21. නීතියෙන් ඉහළ වයස් සීමාවක් නියම කර නොමැති විටෙක අවම වයස් සීමාව අවුරුදු 14 ට අඩු ළමයින් ගෘහාශ්‍රිත හෝ වෙනත් ශ්‍රම අවශ්‍යතා සඳහා කුලියට යොදා නොගැනීම; කෙසේ වෙතත් අනතුරක් වීමෙ සැළකිය යුතු අවදානම් තත්ත්වයකට පත් වීමට ඉඩ ඇති අවස්ථාවන්හිදී වයස අවුරුදු 14 ට වැඩි වුවද ළමයින් සේවයේ යොදා ගත නොහැක.
22. ළමා ශ්‍රමයට අදාළ කම්කරු නීති ඇතළු සියළුම දේශීය නීති සහ සහ ළමා ශ්‍රමය සහ අවම වයස පිළිබඳ ලෝක බැංකුවේ ආරක්ෂණ ප්‍රතිපත්තිවලට අනුකූලවීම.

## සේවා අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් ළමා ඡායාරූප භාවිතා කිරීම

රැකියා හා සම්බන්ධ අරමුණු සඳහා දරුවෙකු ඡායාරූප ගත කිරීමේදී හෝ රූ ගත කිරීමේදී, මා විසින්

23. දරුවෙකු ඡායාරූපගත කිරීමට හෝ රූ ගත කිරීමට පෙර හෝ පෞද්ගලික ඡායාරූප ප්‍රතිනිමර්ාණ කිරිමේදි දේශීය සම්ප්‍රදායන් හා සීමාකරණයන් අධ්‍යයනය කිරීම හා අනුගමනය කිරීමට ගතහැකි සියළු ප්‍රයත්නයන් දැරීම.
24. දරුවෙකු ඡායාරූපගත කිරීමට හෝ රූගත කිරීමට පෙර, දරුවාගෙන් හා දෙමාපියන්ගෙන් හෝ භාරකරුවෙකුගෙන් ඒ පිළිබඳව දැනුවත් කර නිසි කැමැත්ත ලබා ගැනීම. මේ සම්බන්ධයෙන් ඡායාරූපය හෝ චිත්‍රපටය භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳ තේරුම් කරදීමට වගබලා ගැනීම.

---

[1] පුද්ගලයෙකුගේ නිදහස් සහ ස්වේච්ඡාමය අභිප්‍රාය, පිළිගැනීම, යමක්කිරීමට එකඟවීම මත පදනම් වූ දැනුවත් තේරීම **කැමැත්ත** ලෙසට අථර් ගැන්වී ඇත. එවැනි පිළිගැනීමක් හෝ එකඟතාවයක්, තජර්නය කිරීමෙන්, බලෙන් හෝ අන් ආකාර වල සංයෝජනයන්ගෙන්, බලෙන් පැහැරගෙන යාමෙන්, වංචාවෙන්, රැවටීමෙන්හෝ වැරදි ලෙස නිරූපණය කිරීමෙන් ලබා ගන්නා අවස්ථාවන්හිදී කැමැත්ත නොමැති බව සොයාගත හැක. චයර්ාධමර් පද්ධතිය හඳුන්වා දෙනු ලබන රටෙහි ජාතික නීති සම්පාදනයේ අඩු වයසක් දක්වා තිබුණද ලෝක බැංකුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අනුව යමින් වයස අවුරුදු 18ට අඩු ළමයින් යනු කැමැත්ත ලබා දිය නොහැකි අය බවට සලකනු ලබයි. ළමයකුගේ වයස පිළිබඳ වැරදි විශ්වාසය සහ ළමයාගේ කැමැත්ත නිදහසට හේතුවක් නොවේ.

25. ඡායාරූප, චිත්‍රපට, වීඩියෝ සහ ඩීවීඩී තැටි තුළින් ළමයින් නිරූපණය කිරීමේදී ළමයින්ගේ අභිමානය සහ ගෞරවය සුරක්ෂා වන පරිදි එය කිරීමට වග බලා ගැනීම. ඔවුන් අවාසි සහගත බලපෑම්වලට ලක් නොකිරිමට සහ යටහත් නොකිරීමට වග බලා ගැනීම. ළමයින් සුදුසු පරිදි ප්‍රමාණවත් ලෙස ඇඳුම් ඇඳිය යුතු අතර ලිංගික කාරණා ඉස්මතු නොවන ලෙස අදාළ ඉරියව්වලින් පෙනී සිටින ලෙසට වග බලා ගැනීම.
26. ළමා නියෝජනය කිරීමේදී ඒවා සන්දර්භය සහ සත්‍යවාදී කරුණු සමඟ සංගතතාවයෙන් යුක්ත බවට තහවුරු කිරිම.
27. විද්‍යුත් තැපැලෙන් ඡායාරූප යවන විට දරුවෙකු පිළිබඳ හඳුනා ගැනීමේ තොරතුරු ගොනු ලේබල මඟින් අනාවරණය නොවන බවට සහතික වීම.

**දණ්ඩනයන්**

මා මෙම පුද්ගලානුබද්ධ චර්යාධර්ම පද්ධතිය උල්ලංඝනය කළහොත්, මාගේ සේවා යෝජකයා මට විරුද්ධව විනය ක්‍රියාමාගර් ගන්නා බවත් ඒවාට පහත දැක්වෙන දණ්ඩනයන් ඇතුළත් විය හැකි බවත් දනිමි.

1. අවිධිමත් අනතුරු ඇඟවීම්
2. විධිමත් අනතුරු ඇඟවීම්
3. අතිරේක පුහුණු කිරීමේ
4. සතියක් දක්වා වැටුප් අහිමිවීම්
5. රැකියාව අත්හිටුවීම (වැටුප් නොගෙවා), අවම මාස 1 ක කාලයක සිට උපරිම මාස 6 ක කාලයක් දක්වා
6. රැකියාව අවසන් කිරීම
7. අවශ්‍ය වුවහොත් පොලීසියට වාතර්ා කිරීම

පාරිසරික, සමාජමය, සෞඛ්‍යමය සහ ආරක්ෂාවට අදාළ ප්‍රමිතින් සපුරාලීම සහතික කිරීමත්, වෘත්තීයට අදාළ සෞඛ්‍ය සහ ආරක්ෂක කළමනාකරණ සැලසුම පිළිපැදීමත්, එමෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් සේ හැඟවෙන ක්‍රියාකාරකම්වලින් සහ චර්යාවන්ගෙන් වැළකී සිටීමත් මගේ වගකීම බව මම තේරුම් ගනිමි. එවැනි ඕනෑම ක්‍රියාවක් මෙම පුද්ගලානුබද්ධ චර්යාධර්ම පද්ධතිය උල්ලංඝනය කිරීමක් බවට මම අවබෝධ කර ගෙන සිටිමි. ඉහතින් දක්වා ඇති පුද්ගලානුබද්ධ චර්යාධර්ම පද්ධතිය මා විසින් කියවා බැලූ බවත් එහි ඇති ප්‍රමිතීන්වලට අනුකූලවීමටත් මම එකඟවන බවත්, ESHS, OHS, GBV ගැටළු ඇති වීම වැළැක්වීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්විමට අදාළ මාගේ කාර්යභාරයන් සහ වගකීම් මා විසින් පිළිගන්නා බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි. මෙම පුද්ගලානුබද්ධ චර්යාධර්ම පද්ධතිය හා නොගැළපෙන ක්‍රියාවක් සිදුකිරීම හෝ මෙම පුද්ගලානුබද්ධ චර්යාධර්ම පද්ධතියෙන් බලගන්වා ඇති පරිදි ක්‍රියා කිරීමට අපොහොසත් වීම, විනයානුකූල පියවර ගැනීමට හේතු වන බවත් ඉන් දැනට මා නියුක්තව සිටින රැකියාවට කිසියම් අහිතකර බලපෑමක් සිදු විය හැකි බවත් මම අවබෝධ කරගෙන සිටිමි.

අත්සන:

මුද්‍රිත නාමය:

තත්ත්වය/තරාතිරම:

දිනය: